**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2019**
**-------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත්, ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් දිගු කාලයක සිට පැවති ව්‍යාපෘති අරමුදල් තුනක එකතුව රු.602,509 ක් වූ හර ශේෂ සහ අරමුදල් හයක එකතුව රු.3,322,669 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමකින් තොරව එකිනෙකට හිලව් කර රු.2,720,160 ක් වූ ශුද්ධ බැර ශේෂය මූල්‍ය තත්ත්ව | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී මෙම හර සහ බැර ශේෂයන් වෙන වෙනම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ පෙන්නුම් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. | | |
| (ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු එකතුව රු.1,502,528 ක් වූ පාරිතෝෂික ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 80 (ඇ) ඡේදය ප්‍රකාරව ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන් කිරීම ජංගම වගකීම් තුළ පෙන්වීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.11,192,030 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර පොත්වල ගැලපීම සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 හා 2019 වර්ෂවල දී අධිකාරිය ඉදිරිපිට පැවති පැරණි මායිම් තාප්පය වෙනුවට නව මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා වැය කර තිබුණු එකතුව රු.3,635,654 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අයභාර වියදම් ලෙස ආදායමට ලියා හැර තිබුණු අතර, මේ සඳහා තවදුරටත් ගෙවිය යුතුව තිබුණු රු.1,741,535 ක මුදල වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම පැරණි මායිම් තාප්පයේ වටිනාකම හඳුනාගෙන පොත්වලින් ඉවත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව හා තාප්පයේ ඉදි කිරීමට අදාළව අවසන් ගෙවීම සිදු කිරීමට යොදා ගන්නා ප්‍රතිපාදන සම්බන්ධ ගැටළු පැවතුන බැවින් ඊට අදාල උපචිත වියදම් වාර්තා කිරීමට නොහැකි විය. | අයභාර වියදම් හා ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ ආපදා ණය නැවත ගෙවීම් ලෙස රු.470,734 ක් දක්වා තිබූ අතර, එම වටිනාකම වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන අතර, එම ශේෂය සනාථ කර ගැනීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීම් සිදු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | නිරවුල් කළ යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු.1,230,959 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස දෝෂ සහගත ලෙස දක්වා තිබූ අතරම, මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් නොවන ගැලපීම් යටතේ ද ගලපා තිබුණි. | අදහස් දක්වා නැත | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින යුනිසෙෆ් සහ සේව් ද චිල්ඩ්‍රන් යන අරමුදල්වලින් පිළිවෙලින් 2006 සහ 2013 වර්ෂවල ලැබිය යුතු ලෙස රු.235,379 ක් හා රු.256,510 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, එම ශේෂ අයවීම අවිනිශ්චිතව පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,900,087 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.7,438,888 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,338,974 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පරිපාලන වියදම් රු. 15,407,716 කින් වැඩිවීමට සාපේක්ෂව පුනරාවර්තන භාණ්ඩාගාර ප්‍රදාන රු. 30,403,655 කින් වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ 1929 දුරකථන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අදාල ක්‍රමවේදය වැඩි දියුණු කිරීමට නිර්දේශ ලබා ගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත 2016 / 2017 වර්ෂවල දී රු.900,000 ක් ගෙවා තිබුණි. එහෙත් එම වාර්තාව ලබා දී වර්ෂ දෙකක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු වී නොතිබුණි. | 1929 මෘදුකාංගය සමහ නොගැලපීම නිසා මෙම දත්ත පද්ධතිය නැවත වැඩිදියුණු කිරීමට සිදු විය. | පැමිණිලි ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. |
| (ආ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පොලිස් අංශය වෙත 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පැමිණිලි 48,361 ක් ලැබී තිබුණ අතර, ඉන් පැමිණිලි 413 ක් විමර්ශනය අවසන් කර මහාධිකරණය වෙත අධිචෝදනා ගොනු කිරීම සඳහා නීතිපති වෙත යොමු කර තිබුණි. එලෙස නීතිපති වෙත යොමු කරන ලද ගොනු අතරින් 228 ක් සඳහා මහාධිකරණයේ නඩු පවරා නොතිබුණි. | ළමුන් සම්බන්ධ නඩු පැවරීම සහ නඩු කටයුතු ආදිය වේගවත් වී ඇති අතර, අධිකාරියේ මැදිහත් කරණයන් එම නඩු කටයුතු සඳහා දිගින් දිගටම සිදු කරනු ලබයි. ඉදිරියේ දී මේ සම්බන්ධව අවධානය යොමු කොට නඩු පැවරීම් කඩිනම් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිතව ඇත. | නඩු පැවරීම් කඩිනම් කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | 2009 ජනවාරි 06 දින පැවති 23 වන පොදු ව්‍යාපාර කාරක සභා කමිටුවේ දී අධිකාරියට දත්ත ලබා ගැනීමේ නිවැරදි ක්‍රමවේදයක අවශ්‍යතාවය අවධාරණය කර තිබීම හේතුවෙන් 2014 වර්ෂයේ සිට අධිකාරියේ පැමිණිලි විසඳීමේ දත්ත පදනමක් සකස් කිරීම ආරම්භ කර තිබුණි. එම දත්ත පද්ධතිය සඳහා නැවත 2016 වර්ෂයේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයන අංශය සමහ රු.1,200,000 කට ගිවිසුම්ගත වී තිබුණ ද, විගණිත දිනය වූ 2020 ජුනි 30 දින දක්වාම එම දත්ත පදනම නිම කර නොතිබුණි. | මේ පිළිබඳව කොළඹ විශ්වවිද්‍යාලය සමහ සාකච්ඡා සිදු කර ඇති අතර, එය කඩිනමින් විසඳා දෙන ලෙස ලිඛිතව දන්වා ඇත. | පනත ප්‍රකාරව ජාතික දත්ත පදනමක් සකස් කිරීම හා එය පවත්වා ගෙන යාම සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) පැමිණිලි විසඳීමේ දුර්වලතාවයන් හේතුවෙන් 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අධිකාරිය වෙත වාර්තා වී තිබුණු පැමිණිලි 81,259 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැමිණිලි සංඛ්‍යාව 41,142 ක් නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ අතර, එය මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය. | මෙම පැමිණිලි ගොනු අවසන් කිරීම සඳහා මේ වන විට කඩිනම් වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත. | නොවිසඳී ඉදිරියට ගෙනවිත් තිබූ පැමිණිලි කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 534 ක් වූ අතර, තත්‍ය කාර්ය මණ්ඩලය 348 ක් වූයෙන් තනතුරු 186 ක පුරප්පාඩු පැවතුණි. | බඳවා ගැනීම් සඳහා ඉදිරි කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මානව සම්පත් කළමනාකරණය විධිමත් පරිදි සිදු කල යුතුය. |
| (ආ) නිලධාරීන් බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම සහ සේවයේ නියුක්ත නිලධාරීන් අදාල තනතුරුවල රඳවා ගැනීම සඳහා වැටුප් සංශෝධනය කිරීම දීර්ඝ කාලයක සිට සිදු කර නොමැති වීම හේතුවෙන් අධිකාරියේ සේවක පිරිවැටුම ඉහළ යාමත් සමාජ වගකීම ඉටු කිරීමේ ප්‍රමාදයද විගණනයේ දී නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරීන් ගේ වැටුප් තල සම්බන්ධව පැවති ගැටළු විසඳීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කොට මේ වන විට දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී සහ දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරි තනතුරු දෙක සඳහා වැටුප් තලය ඉහළ දැමීමට යෝජනා වී ඇත. හිඟ පැවති වැටුප් වර්ධක කඩිනමින් ලබා දීම, ස්ථිර කිරීම්වලට අදාල කටයුතු අවසන් කරමින් පැවතීම සහ ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කිරීම යන ක්‍රියාවලි විධිමත් කර ඇත. | මානව සම්පත් කළමනාකරණය විධිමත් පරිදි සිදුවිය යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ළමා අපයෝජනයන්ට ගොදුරු වූ වින්දිත ළමුන් සඳහා පහසුකම් සැලසීමට රු.250,000 ක් සහ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම හා නඩත්තු කටයුතු වෙනුවෙන් රු.1,500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් පිළිවෙලින් රු.51,000 ක් හා රු.27,000 ක් පමණක් වැය කර තිබුණි. | ඉදිරියේ දී අනුමත ස්ථිර තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ පසු නිසි පරිදි ප්‍රතිපාදන භාවිතා කරමින් ලැබෙන ඉල්ලීම අනුව සාක්ෂි පටිගත කිරීම් විධිමත්ව උපරිමයෙන් සිදු කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ)ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන් ගෙන් ආරක්ෂා කරමින් ඔවුන්ගේ සුරක්ෂිත බව තහවුරු කිරීම වෙනුවෙන් වැඩිහිටි ප්‍රජාව දැනුවත් කිරීම හා ඒ පිළිබඳ සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ අරමුණින් සිවිල් සමාජ ක්‍රියාකාරින් හඳුනා ගැනීමේ දිප ව්‍යාප්ත වැඩසටහනක් වශයෙන් 2018 වර්ෂයේ සිට ජන පවුර වැඩසටහන ගම් මට්ටමින් ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය වූ රු.6,577,000 ක මුදල අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 ක් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ ග්‍රාමීය සිවිල් සමාජ ක්‍රියාකාරීන් හඳුනා ගැනීම සඳහා පමණක් වැය කර තිබුණි. | ජනපවුර වැඩසටහන ජනාධිපති කාර්යාලයේ දරුවන් සුරකිමු වැඩසටහනේ මූලා ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ වැඩසටහනකි. 2019 දෙසැම්බර් 17 දින සිට මෙම වැඩසටහන් ඉදිරියට ක්‍රියාත්මක නොකරන බව ජනාධිපති කාර්යාලය මඟින් දන්වා ඇත. වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කිරීමට ගැටළුකාරී තත්ත්වයක් ඇති විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සඳහා සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී තිබුණු රු.8,075,000 ක ප්‍රතිපාදනවලින් රු.1,975,000 ක් ශ්‍රී ලංකාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික මාර්ගෝපදේශය සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම සඳහා වැඩසටහන් 25 ක් පැවැත්වීමට වෙන්කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු.478,000 ක් වැය කර දිස්ත්‍රික්ක 7 ක නිලධාරීන් 415 ක් සඳහා වැඩසටහන් 7 ක් පමණක් පවත්වා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ මුළු ප්‍රතිපාදනවලින් රු.4,805,000 ක් එනම්, සියයට 59 ක් පමණක් වැය කර තිබුණි. | ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා වන ජාතික මාර්ගෝපදේශ සංග්‍රහයේ මුද්‍රණය අවසන් කර ඇත්තේ 2019 වසරේ අගෝස්තු මාසයේ දී ය. එබැවින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත්තේ මෙම මාර්ගෝපදේශය මුද්‍රණය කිරීමෙන් අනතුරුව බවත්, නොවැම්බර් මාසයේ ජනාධිපතිවරණය පැවැත්වීම හේතුවෙන් රැස්වීම් පැවැත්වීමට නොහැකි වීමද මේ සඳහා හේතු සාධක විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) 24 පැය නොමිලේ ළමා දුරකතන සේවය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා රු.4,250,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ අතර, එයින් රු.2,900,000 කින් කළ යුතුව තිබූ කාර්යයන් ගෙන්, සර්වර් කාමරය ස්ථාපිත කිරීම, නිලධාරීන් සඳහා රාක්ක තැනීම හා 1929 ඇමතුම් මධ්‍යස්ථානය සඳහා පුටු මිලදී ගැනීඉටු කර නොතිබුණි. | 2019 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමේ ප්‍රමාද වීම සහ අනුමැතිය ලබා ගැනීමේ දී ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් මත මෙම ක්‍රියාකාරී සැලසුම යටතේ සැලසුම් කළ කාර්යයන් ප්‍රමාද වීමක් සිදු වී ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.2** **අභ්‍යන්තර විගණනය**

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009 /(1) හි 3 ඡේදයට අනුව අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණි. | අධිකාරියේ පවතින පුරප්පාඩු පිරවීමට අපහසු වීම මත දැනට සිටින කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුයුක්ත කිරීම අපහසු වී ඇත. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතුය. |

**4.3** **අයවැය පාලනය**

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට දරන ලද වියදම් පදනම් කර ගෙන 2020 අගෝස්තු 08 දින අයවැය ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. | අදහස් ඉදිරිපත් කර නැත. | අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන ක්‍රමයක් ලෙස යොදා ගත යුතුය. |